


**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

### පොත් පිටු අතර කැඩපත්

උන් වහන්සේ 'බුදුහු මා හා කථා නො කරණ සේකැ'යි තුන් මසක් මුළුල්ලෙහි බුදුන්ට කයින් ළං ව ගත නො හී 'බුදුන් දැක්ක නො හෙන මාගේ ජීවත් වීමෙන් ප්‍රයෝජනකිම් ද, පර්වතයට නැඟී ලා වැටී ගොසින් මියෙමි'යි ගිජු කුළු පවුවට නැඟි සේක.

\- වක්කලී තෙරුණ්වහන්සේගේ වස්තුව -
සද්ධර්මරත්නාවලිය

**තිගැස්සෙමි,**
**පොත් පිටු අතර කැඩපත්**

**මා මෙන්ම**
**පතා එක් තනි බැල්මක්**
**ගඟ ළඟම හිඳ**
**තිබහින් දැවෙන්නට ඇති ඔබ**

**නිහඬව තනිව රුක් මුල**
**ලිහන්නට ඇති දෙසු දම්**
**දකින්නට යම් තෙතක් සිසිලක්**

**වට අවට මහ සෙනග මැද**
**එකලාව කතරක**
**සොයන්නට ඇති ඔබ**
**කුඩා ඊතණ පඳුරක්**

**පිටුවහල් කළ පසු**
**නගින්නට ඇති ගිජු කුළ**
**උතුරන විට දෙනෙත**
**තෙමෙන්නට ඇති ගල් පඩි**
**මට මෙන් නොව ඔබට**
**ගිගුම් දීගෙන සිහිලට**
**වහින්නට ඇති එවිට**

**ඉසුරු චාමර සෝමවීර ( 'අප දෙදෙන මැද මහ මුහුද' කාව්‍ය සංග්‍රහය - 2016 )**



'පොත් පිටු අතර කැඩපත්' නම් අපූරු හිසින් යුතුව මේ කවිය ලියන ඉසුරු මීට පාදක කරගන්නේ තමන්ගේ අතිශය පෞද්ගලික වේදයිතයන්ය; දැක්මක්ය. එය වඩාත් පුළුල් අර්ථයෙන් ගෙනහැර පෑමට ඔහු සද්ධර්මරත්නාවලියේ එන වක්කලී තෙරුණ්ගේ කතා වස්තුව ඇසුරු කරයි. ඔහු එය තම පාද සටහනේ සඳහන් කොට ඇත. නමුත් ඔහු එය යොදාගන්නේ ඉතා අපූරුම ආකෘතියකිනි; සියුම් පරිස්සම් සහගත ඔහුටම අනන්‍ය රටාවකිනි. බොහෝ කවි ලියන අය කරන්නේ බෞද්ධ කතන්දරවල එන චරිත හා ස්ථාන නාමයන් අමු අමුවේම පරිඝනක මෘදුකාංගයකින් කළාක් මෙන් ක්ෂණිකව වර්තමාන දෛනික නාමකරණයන් ගෙන් ප්‍රතිස්ථාපනය කිරීමයි. එනම් බෞද්ධ කතා පුවතම වත්මන් වචන මාලාවකින් නැවත ලිවීමයි. ඒවායේ කාණු සෝදන්නේ සෝපාකලා වෙනුවට නගර සභාවේ වැඩ කරන සිරිපාලලාය. කිරිපිඬු වෙනුවට ඇත්තේ දවල් කෑම පැකට්ටුවයි. සුජාතා වෙනුවණට රමණී හෝ කමලා දුව ඇවිත් බුදුන් වෙනුවට, වැඩෙහි යෙදෙන තම හිමියාට දිවා ආහාර සපයයි. අප්පල් නුගය වෙනුවට හෙට අනද්දා කපා බිම දමන්නට නියමිත තේක්ක හෝ කොස් ගසක් පසෙකින් ඇත. එහිම අනිත් පැත්ත නම් වර්තමාන සිද්ධිමාලවක නම් ගම්වලට චිරන්තන සාහිත්‍යයෙන් වචන පමණක් සොරකම් කර ගැනීමයි. එවැනි නිර්මාණවල සඳකිඳුරන් කුලී වැඩ කරයි. බ්‍රහ්මදත්තලා චෙක් පොත් ලියයි. රජ්ජුමාලාවන් ගෙල වැල ලා ගනියි. කන්ථකලා රේස් දුවයි. මේ නම් කොතරම් සරල ලිවීමේ ප්‍රාථමික උපක්‍රමයක්ද?

නමුත් ඊට එහා ගොස් තමාගේම ජීවන දැක්මක් වඩාත් තීව්‍රව කීමට හා ඒ ඇසුරින් විවිධ අර්ථයන් ව්‍යුත්පන්න කොට සමාජයීය ඥානනයක් ඇතිකිරීමට බෞද්ධ සාහිත්‍යය හෝ චිරන්තන සාහිත්‍යය, දර්ශනයක් එහෙම නැත්නම් හරයක් ලෙස යොදාගන්නේ කෙසේද යන්න ඉසුරුගේ මේ භාවිතාව තුළ කැඩපතක් සේම විශද වී පෙනෙන්නට ගනී. ඒ ඔහුගේ නිසග ප්‍රතිභාව නිසාවෙනි.

කවිය ඇරඹෙන්නේම තිගැස්සීමකිනි. ඒ පොත් පිටු අතරින් කැඩපත් මතුවීමෙනි. කැඩපතක් වූකලී අපට අපවම කවුදැයි කියා බලා ගන්නට, අවබෝධ කරගන්නට අවකාශ සලසන මහරු නිමැවුමකි. නමුත් මෙය හමුවන්නේ පොත් පිටු අතරිනි. එනම් ඔහු කියවන පොතක අන්තර්ගතයේ යම් තැනක ඔහු වෙනුවෙන් කැඩපතක් මතුවී ඇත. එනම් තමාටම මේ ඉන්නේ තමා නොවේදැයි හැඟෙන, පෙන්වාදෙන යම් තැනක් ළඟ ඔහුගේ දෑස නතරව මේ තිගැස්සීම ඇතිවී ඇත. පාද සටහන ඔස්සේ අනුමාණ කරන්නේ නම් ඔහු කියවමින් ඉන්න ඇත්තේ සද්ධර්මරත්නාවලිය බවත් ඔහු තිගැස්සුණේ වක්කලී තෙරුණ්ගේ කතා වස්තුව අතරමැද බවත් නිශ්චිතය.

දැන් අපව සිතන්න පොළඹවන්නේ මෙවැනි තිගැස්සීමක් කවියාට ලැබුණේ ඇයි කියාය. පොත් පිටුව කැඩපතක් වී තමාගේම ප්‍රතිබිම්භය තමාටම පෙන්වා දුන්නේ නම්, ඒ ඔහු කියවමින් සිටි දෑ හි ඔහු සිතනාකාරයට ඔහුට යම් සමානකමක් තිබෙන කවුරුන් හෝ මුණ ගැසිය යුතුය. 'මේ ඉන්නේ මා වැනිම තවෙකෙක් නොවේදැ'යි කියා ක්ෂණික තිගැස්සීමක් ඔහුට ලැබෙන්නේ ඒ අයුරින් විය යුතුය.

කවියේ දෙවැනි කොටසේ ඉතා සීමිත තෝරාගත් වචන සංඛ්‍යාවකින් කියවෙන්නේ පොතේ හමුවූ චරිතය, එනම් වක්කලී තෙරුණ්, නොඑසේ නම් තමාම වන්වූ අනෙකා සමග සිදුවන අන්තර්භාෂණයයි. එය හෘදය සංවාදයකි; බාහිරට නිහඬය. නමුත් තමන්, තමන් සමගම කරන මහා දෝංකාරාත්මක හැඬවුමක් බඳු පසුතැවිල්ලකි ඒ. වක්කලී තෙරුණ් දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හෙබී බුදුන්ගේ රුවට බැඳී බුදුන් දැකගනු රිසින් ධර්මයට සිත් නොයොදා බුදුන් යනෙන ගැවසෙන තන්හි තන්හි රැඳෙමින් කල් මැරූයේ ඒ තනි බැල්මම පතාගෙනය. පුරුෂ සිතක් තුළ තවත් පුරුෂයකු වෙනුවෙන් පහළ වූ ඒ ලාලසාව ගැන කියවන විට අප කතකයා තිගැස්සී යන්නේ මෙන්න මේ සමරූපීතාව නිසාවෙනි. එනම් මේ කවියද ලියැවී ඇත්තේ පුරුෂ සිතක් වෙනුවෙන් ඇලුණු තවත් එවැනිම පුරුෂයකුගේ උක්ත ස්වරයෙන් බැවිනි. කවිය ඇතුළෙන්ම අපට හඳුනාගැනීමට ඉඩහැරෙන චරිතයේ ජීවන ඇවතුම් පැවතුම් එසේ යැයි සිතාගෙන අපට මේ කව වඩාත් හොඳින් විධාරණය කරගන්න ඉඩ සැලසෙන අතර, මෙය ලියූ කවියාගේ ඇත්ත ජීවන පැවතුම් එසේ වුවද නොවූවද මේ කවිය අප විඳින මග ඔස්සේ විඳගෙන යාමට එය කිසිම බාධාවක් නොවන්නේමය. ඒනයින් ගත් කළ, කවියා කුමක් කීවද, කවිය විසින්ම අනවන මගක අපේ රස වින්දන පථය පිහිටුවාගැනීම අපේ කාර්යභාරය වඩාත් පහසුකරනවා ඇත.

වක්කලී තෙරුණ් සේම යම්කිසි තනි බැල්මක් වෙනුවෙන් සිත් ඇරගෙන අප කතකයාද දිවා රෑ හිඳින්නට ඇත. අත නුදුරේම ඔහුව පෙනි පෙනී ලැබී නොලැබී තියෙන්නටද ඇත; ළං වෙවී වෙන් වෙවී ඉන්නටද ඇත. ඉතින් මේ වේදනාව එදා වක්කලී තෙරුණ් විඳි වේදනාවම නොවන්නේද? තමා රිසි දේ තමාට පෙනි පෙනීම තිබියදීත් නොලැබී යාම මොන තරම් නම් වේදනාබර ශෝකී දෙයක්ද? තමා මෙන්ම වක්කලී තෙරුණුත් එදා ඒ තනි බැල්ම පතාගෙන අත නුදුරෙන්ම සීතලට ගඟ ගලා යද්දීත් පිපාසයෙන් දැවෙන්නට ඇති යැයි අප කවියා අනුමාණ කරයි. බුදුන්ගේ රූපශ්‍රීයට වශීකෘත වී උන්නද කවදාවත් බුදුන්ට ගතින් ළංවන්නට වක්කලී තෙරුණ්ට නොහැකි වුණි. ඉතින් අද මේ දෙය මෙලෙසම අත්දකින අප කවියාටත් වක්කලී කතා පුවත ඔස්සේ තමාට තමාවම පෙනෙන්නට ගැනීම තිගැස්සීමක් වන්නේ ඒ අයුරිනි. අත්හැරිය යුතු බොහෝ දේවල් අත්හරින්නට සැදී පැහැදුණ බුදු පුතකුටත් ඒ තනි බැල්ම උහුලාගත නොහැකි වුණි නම්, අප කවියා පෙළෙන ඒ වේදනාව කොතරම් දැයි ඉටාගන්නට, ඔහු රිදවන ඒ තනි බැල්ම කොයි තරම් තියුණුදැයි හිතාගන්නට වෙනත් දෑ ඇවැසි නොවේ නේද?

අනතුරුව කවිය දිග හැරෙන්නේ මේ ස්වයං අන්තර්භාෂණය ඔස්සේමය; ඔහුගේ උපකල්පන ඇසුරේමය. සමරිසි ආකර්ෂණයන් හෙළාදකින සමාජයක, සෑමදෙනාම එක වාගේ වියයුතු යැයි පතන සමාජයක, වක්කලී තෙරුණ්ටත් තමාට මේ සමාජයෙන්ම මුහුණ පාන්නට වූ සියල්ලම අඩු වැඩි වශයෙන් විඳින්නට වෙන්න ඇතැයි සිතමින් අප කතකයා යම් යම් දේ අනුමාණ කරගන්නට උත්සාහ ගනී. එය විටෙක ඔහුට සහනය සලසයි; හිත හදාගන්නට උදව් කරයි; විටෙක හඬවයි; යළි නැගිටුවයි. එදා වක්කලී තෙරුණ් සිත් වේදනා ලැබ නිහඬව රුක් මුල් ළඟ තනිව සිත සිතා ඉන්නට ඇත. බුදුන්ට ළංව ගත නොහී ඒ ආශාවන් මැඩපවත්වා ගත නොහී දහසකුත් වේදනාවන් විඳින්නට ඇත. පොඩි හෝ සැනසුමක් තෙතක් සිසිලක් ලබන්නට බුදුන් දෙසූ ධර්මය යළි යළිත් මෙනෙහි කරගන්නට උත්සාහ ගන්නට ඇත. නමුත් ඒ කිසිවකින් හිත හදාගන්නට නොහැකිව පෘථග්ජන පුද්ගලයකු සේම බුද්ධ රූපශ්‍රීය මත්තේම ඇලී ගැලී දුක්ඛ වේදනාවන් මතම කල් මරන්නට ඇත. මේ අප කවියා අප වෙනුවෙන් හිතන දෑය.

තව දුරටත් කවියා විසින් ගෙනහැර පානා පරිදි ඔහුගේ පරිකල්පනය දිගු දුරට විහිදේ. වක්කලී තෙරුණ් හිත හදාගනු බැරිව මහා සෙනගක්, එනම් දස දහස් ශ්‍රාවක පිරිස් මැද මහා හුදකලාවක කල් ගෙවන්නට ඇත; ගල් ගැහෙන්නට ඇත. තමන් රිසි දෙයක් නොලද විට ඒ මහා භූමි භාගයම ඔහුට කතරක්ව පෙනෙන්නට ඇත. ඒ කතරෙහි කුඩා ඊතණ පඳුරක් බඳු එකදු හිතට සැනසුමක් ගෙනෙන දෙයක් සොයමින් පා ගෙවෙනතුරු ඇවිදින්න ඇත. මෙලෙස මහා පුරුෂයකු වෙනුවෙන් ඇලුණු තවත් එවැනිම පුරුෂයකුගේ ජීවන තතු උපකල්පනීය ස්වරයකින් කියමින් අප කවියා ඇත්තටම කියන්නේ ඔහු ගැන නොවේද? කැඩපතින් දුටු ඔහුගේම ජීවිතය වෙනත් රූපයක් ඔස්සේ අපට පෙන්වමින් ඔහුගේ චෛතසිකයන් හා වේදයිතයන් විධාරණය කරමින් ඒ වේදනාව තේරුම් ගැනීමට අපට මගක් හැර දීමක් නොවේද මේ ඔහු කරන්නේ? අප කවියාට සිදුව ඇති පරිදි සංස්කෘතික සමාජ කාන්තාරයක කූඩා ඊතණ පඳුරක් වත් නොලැබ සියලුම දුක්ඛ දෝමනස්සයන් තමා අතුළේම රුවාගෙන විඳවන්නට වීම, මේ සමාජය විසින් යමෙකුගෙන් පතන අසාධාරණ පැවතුමක අනුවේදනීය යතාර්ථයමය.

දැන් අපි කවියේ අවසාන කොටසට එළැඹ ඇත්තෙමු. සිත් රිදුම් වලින් ඇති තරම් බැට කා බුදුන්ට ළංව ගත නොහුණු වක්කලී තෙරුණ් තමාගේ ජීවිතය පිළිබඳ අවසාන තීරණයකට පැමිණේ. ඒ බුදුන් දකිනු නොහෙන තම ජීවිතයෙන් ඵලක් නැතැයි සිතා ගිජුකුළ නැග ඉන් පැන සිය දිවි නසා ගැනීමට තීරණය කිරීමයි. පුරුෂයන් වෙනුවෙන් ජීවිතය පවා අත් හරින්නට සැදී පැහැදුණ පුරුෂයන් එදාත් උන් බව දැන ගැනීම අප කවියාට පුංචි හෝ අස්වැසිල්ලක් විය හැක. නමුදු එය විටෙක දුකද කැඳවයි. මේ මහා හුදකලා විඳගැනීම, එනම් දහසකුත් එකක් සමාජයීය අවලාදයන් මත නොසෙල්වී හිඳිමින් තමාවම නියෝජනය කිරීම මොන තරම් අභියෝගයක්ද? විටෙක උහුලාගන නුහුණුම මොහොතක පෘථග්ජන මනස පිපිරී විසිරී යාමටද ඉඩ ඇත. බුදුන් ඇසුරේම හුන් වක්කලී වන් තෙරුණ් කෙනෙකුටත් එසේ හිතුණා නම් තමා වන් කුරා කුහුඹු මිනිසකු කිසිවකුගේ එක හෝ ආදරණීය වචනයකින් තේරුම්ගැනීමකින් තොරව මේ සියල්ල තනිව විඳ දරාගන්නේ කෙසේද යන්න පැණයක්ම විනා පිළිතුරක් නොවන්නේ එනිසාවෙනි. එය මහා බැරෑරුම්, අප විසින් නැවත නැවතත් සිතිය යුතු සමාජයීය ප්‍රශ්නයක් වන්නේ ඒ අයුරිනි.

අප කවියා කවියේ අන්තිම පද පේළිවලින් වක්කලී තෙරුණ් සිය දිවි නසා ගැනීමට ගිජුකුළ නගිනයුරු චිත්තරූප මවා පෙන්වයි. වක්කලී දෑස එවෙලෙහි කඳුළින් පිරී කඩා වැටෙන්නට ඇත. ඒ කඳුළුවලින් පර්වතයේ ගල් පඩි තෙමී යන්නට ඇත. නමුත් කවියේ අවසාන පදවලින් කූට ප්‍රාප්තියට රැගෙන ගොස් ඔහු මුළු මහත් සමාජය හමුවේම ඉතුරු කරන එක ප්‍රශ්නයක් ඇත. එනම් ඒ සෝබර මොහොතේ පරිසරය පවා සත් යළක් කම්පා වී ඒ වේදනා තාපයන් නිවාලන්නට ගිගුම් දී සිහිල් වැසි වස්සවන්න ඇති බවයි. එය කවියාගේ පරිකල්පනයේ උපරි තලයක් අපට කියා පායි. මේ පරිසරය විසින් හෙළන වැසි ධාරා යනු බුදුන් මේ දේ දිවැසින් දැක එතැනට වැඩ ඔහු වෙනුවෙන් හෙළූ කාරුණික බැල්මක් විය හැක. ඒ අයුරින් ගත් කළ වක්කලී තෙරුණ්ගේ අවසාන මොහොතේ අඩුම තරමින් ඔහු හුදකලා වූයේ නැත. ඔහු වෙනුවෙන් කඩා හැලුණු ආදරයක් පරිසරයෙන් පවා ඔහු විඳින්නට ඇත. නමුත් ඒ එදාය. අප කවියා අප වෙනුවෙන් ඉතුරුකරන, අප ගොළුවෙන සමාජයීය ප්‍රශ්නය වන්නේ කවදා කවර අයුරකින් එවැනි තනි බැල්මක් පතාගෙන වේදනා විඳින ඔහු වෙනුවෙන් ඇරුණු සිහිලසක් මේ මුළු මහත් සමාජය කෙරෙන් ඔහු වෙත ලැබේද යන්නය. එය නම් සදාකාලික ප්‍රශ්නයක් වාගේය. ඔහු වෙනුවෙන් පරිසරය පවා සුළඟක් වට වැසි පොදක් කිසිදා නොදෙනු ඇත. එවන් මානුෂීය සමාජයක් කවදා මේ පොළවේ ස්ථාපනය වේදැයි යන්න කුහුලක් ලෙස රඳවමින් ඒ කවිය අවසාන වේ.

අතිශය පෞද්ගලික අනුභූතියක් චිරන්තන සාහිත්‍යය ඔස්සේ නවමු ආකාරයකට අපට පිරිනමන ඉසුරු, සංස්කෘතික සමාජයීය හා දේශපාලන කාන්තාරායක තාමත් අප ගෙවන මේ සාම්ප්‍රදායික එනම් අසාධාරණ චින්තන ධාරව එලෙස ප්‍රශ්න කරයි. ඔහු එය කිසි විටෙකත් වෛරීය ස්වරයකින් නොපවසයි. ඉතාම සියුම් තෝරා බේරාගත් වචන ඔස්සේ මහා කතාන්දරයක් කියාපාන ඉසුරු, අපිට අප ගැනත්, මේ සමාජයේ ජීවත් වන අන් අය ගැනත් වඩාත් මානුෂික දෘෂ්ටියකින් බලන්නට කවුළුවක් හැර දේ. කෙටියෙන්ම කියනවා නම්, අනෙකාගෙන් අප පතන අපගේම අසාධාරණ ආත්මාර්ථකාමීත්වය අපටම බලා කියා ගන්නට කැඩපතක් අප වෙතට හරවා පෙන්වයි. එය මිනිසුන් ලෙස අපට අප ගැනම ලජ්ජාවක් ඉතුරු නොකරන්නේද?

මිනිසුන් විවිධාකාරය; විෂමය. ඔවුන්ගේ සිතුම් පැතුම් මෙන්ම ආශාවන්ද විවිධ ස්වරූප ගනී. ඉතින් අප සියලු දෙනාම එක වාගේ වියයුතුමද? කලින් නියම කර ඇති එකම ආශාවන් ලාලසාවන් හා හැසිරීම් පද්ධතියක් පසු පස අප හඹා යා යුතුමද? අප සියලු දෙනාම සතු විවිධාකාර විෂම රටාවන් මත ගොඩනැගුණු විවිධ විචිත්‍ර ලස්සනක් මේ පොළව මත පිපී හිනැහීම සතුටක් ලෙස බාර ගැනීමට අප තවත් පරක්කු විය යුතුද? අප දකිනු රිසි කණ්ණාඩියෙන් ලෝකය හා මිනිසුන් නොදැක, ලෝකය අපට පෙන්වන පිරිනමන දෑට සියුම්ව සංවේදී වූ කල, ඔබටත් මටත් අපවම පැහදිලිව පෙනියන කැඩපතක් හමුවී සැණෙන් තිගැස්සෙන්නට බැරි නැත.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com